අසාත්මිකතාවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා ආයතනය විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2026 නොවැම්බර් මස 19 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත අයදුම්පත් කැඳවනු ලැබේ.

අසාත්මිකතා විද්‍යා අධ්‍යයනාංශය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුර

i. අයදුම්කරුවන් වෛද්‍යවේදී (MBBS) උපාධියක් ලබා තිබිය යුතුය.

ii. අසාත්මිකතා විද්‍යාව/ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ PhD උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයක (වෛද්‍ය විද්‍යාව/ළමා රෝග/අසාත්මිකතා විද්‍යාව සහ ඝායනික ප්‍රතිශක්ති විද්‍යාව) MD උපාධියක් ලබා ඇති අය සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

සුදුසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://iai.ac.lk/careers වෙබ් අඩවියට පිවිසෙන්න.

කොන්ත්‍රාත් කාලය - වසර දෙකකි.

වැටුප හා ප්‍රතිලාභ - ආසන්න දළ මාසික වැටුප රු. 287,145/- කි.

ප්‍රතිලාභ:

තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ මාසික වැටුපෙන් 10%ක් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට (Universities Provident Fund) දායකත්වයක් ලෙස අයකරනු ලබන අතර, ආයතනය විසින් එම අරමුදලට 15%ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. ඊට අමතරව, ඔවුන් සේවක භාරකාර අරමුදලේ (Employees' Trust Fund) සාමාජික දායකයින් බවට පත්වන අතර, විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3%කට සමාන මුදලක් එම අරමුදලට දායක කරනු ලැබේ.

අයදුම්පත් සහ අදාළ විස්තර

අයදුම්පත් https://iai.ac.lk/careers වෙබ් පිටුවට පිවිස බාගත කරගත යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, අදාළ සහතිකවල සහතික කළ පිටපත් සමග **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අසාත්මිකතාවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සම්පූර්ණ කරන ලද ලේඛනයේ ස්කෑන් කළ පිටපත 2026 නොවැම්බර් මස 19 දින හෝ ඊට පෙර recruitments.iai@sjp.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට ද එවිය යුතුය.

අයදුම්පත සාර්ථකව ඉදිරිපත් කළ බව තහවුරු කරමින් අයදුම්කරුවන්ට විද්‍යුත් තැපැලක් ලැබෙනු ඇත. අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු එය සංශෝධනය කිරීමට අවසර නොලැබේ. ඉදිරි සියලුම නිවේදන විද්‍යුත් තැපැල මගින් පමණක් දැනුම් දෙනු ලැබේ.

වැදගත්

අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය ආයතනය සතුය. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
අසාත්මිකතාවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
05.11.2026